**මිනුවන්ගොඩ නගර සභාව - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මිනුවන්ගොඩ නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් විස්තරාත්මක කළමනාකරණ වාර්තාවේ පහත අංක යටතේ සඳහන් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.
1.2.2(ඇ) 1.2.5 (ආ), 2.2.2, 3.2(ආ)(ඇ), 3.3.1, 3.4 හා 3.5

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිති අංක 18.7 හා LGD/10A/4/න.ගි./2019 අංක දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව ලිබඩු සඳහා වූ සවිකිරීම්, සභාව සතු මාර්ග හා ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් සභාව සතු ඉඩම් 11 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2021 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රමිති අංක 9.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම්වලින් වර්ෂයේ කළ ගෙවීම්, අතිරික්තයේ හඳුනාගත් ප්‍රදාන ලෙස අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ සටහන් කළ යුතු විය. එහෙත් ලැබූ රු 11.961,854 ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂයේ රු.4,395,902 ක ප්‍රතිපාදන මුදලම සටහන් අංක 05 යටතේ පුනරාවර්තන නොවෙන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් යටතේ වර්ෂයේ ආදායමට ගලපා තිබීමෙන් එම ප්‍රමාණයෙන් අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහාවූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ප්‍රමිති අංක 9.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම්වලින් වර්ෂයේ කළ ගෙවීම්, අතිරික්තයේ හඳුනාගත් ප්‍රදාන ලෙස අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ සටහන් කළ යුතු වුවත් ඉතිරිය වූ රු.7,565,952 ක මුදල එසේ දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | |

### 1.6.2 ගිණුම් ඉදිරිපත් කිරීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පහදාදීම හා මඟපෙන්වීම යටතේ වූ EG 3.1 ප්‍රකාරව 2020 වර්ෂයේ කර්මාන්ත සඳහා වන රු.33,728,431 ක අගය කෙරීගෙන යන වැඩ ලෙස දැක්විය යුතු වුවද, ජර්නල් මඟින් වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | බස්නාහිර පළාත් පළාත් පාලන කොමසාරිස් ගේ LGD/09/2019(1) දරන හා 2020 අගෝස්තු 24 දිනැති ආකෘති පත්‍ර චක්‍රලේඛය අනුව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම් ස්කන්ධ / වෙනස්වීම් ප්‍රකාශය සඳහා වූ ආකෘතිය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා නිවැරදිව අදාල කර ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ආකෘතිය නිවැරදිව අදාල කර ගත යුතුවේ. |
| (ඇ) | හුවමාරු ගණුදෙනුවලින් ලැබියයුතු දෑ ලෙස ගිණුම්ගත කළ යුතු රු.654,217 ක ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී මුදල, පෙර ගෙවුම් හා ලැබිය යුතු දෑ යටතේ ගිණුම්ගත කර තිබුණි. | හුවමාරු ගණුදෙනු ලැබිය යුතු දෑ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදි ගිණුම් ගත කළ යුතුවේ. |

### 1.6.3 මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ LGD/10A/4/න.ගි/2019 හා 2021 පෙබරවාරි 12 දිනැති චක්‍රලේඛයේ 06 වගන්තිය ප්‍රකාරව ආයතනය මඟින්/ආයතනයට එරෙහිව ඉදිරිපත්කර ඇති නෛතික ක්‍රියාමාර්ග පිළිබඳව සටහනක් මඟින් හෙළිදරව් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී,හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව හෙළිදරව් කළ යුතුවේ. |

### 1.6.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යන්ත්‍ර, ලී බඩු උපකරණවල මුළු ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු.15,046,040 ක අගය, යන්ත්‍ර හා ලී බඩු ගිණුම්වලට | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වෙන් වෙන්ව ප්‍රත්‍යාගණන වටිනාකම | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | වෙන් වෙන්ව ගිණුම්ගත නොකර මුළු මුදල යන්ත්‍ර ගිණුමට ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්ගත කරන බව දන්වමි. | |
| **(ආ)** | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබූ පුස්තකාල පොත් රු.123,997 ක වටිනාකමක් ශුද්ධවත්කම් /ස්කන්ධය යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට කෙටිකාලීන ගෙවිය යුතු දෑ යටතේ ගිණුම්ගත කර තිබුණි. | තොග ශේෂයට ඇතුලත් කරන ලෙස දක්වා ඇති බව දන්වමි. | සියළු හිඟ ගිණුම් ගත කළ යුතුවේ. |
| **(ඇ)** | ජ'නල් සටහනක් මගින් විවිධ වියදම් ගිණුම් හර හා විවිධ ණයහිමියෝ බැර කරමින් රු.40,155,600 ක වෙන් කිරීම් සිදු කර තිබූ අතර තවත් ජ'නල් සටහනක් මගින් ගබඩා සැපයුම් ණයහිමියන් යටතේ වෙන් කල රු.1,364,112 ක් විවිධ ණයහිමි ශේෂය තුළ ඇතුලත්වී තිබීම නිසා ගබඩා සැපයුම් ණයහිමියෝ රු.1,364,112 ක් ද්විගනණයවී තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුවේ. |
| **(ඈ)** | සටහන් අංක අනුව දේපල පිරියත හා 16 උපකරණවල වර්ෂයේ ආරම්භක වටිනාකම රු.8,998,093 ක් හා වර්ෂයේ එකතු කිරීම් රු.300,630 ක් වූවද එම වටිනාකම් ජනල් සටහන් මගින් සමුච්චිත අරමුදලට ලියා හැරීමෙන් සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ ලී බඩුවල වටිනාකම ශුන්‍ය අගයක් ගෙන තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| **(ඉ)** | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී වන වෙනස්කම් සංචිත හා වෙන්කිරීම් ගිණුමකට ගැලපුම්කර තිබූ නමුත් ප්‍රත්‍යාගණනයේදී වත්කම්වල අගය වැඩිවීම රු.1,133,243,389 ක් වුවද සංචිත ගිණුමට ජ'ර්නල් සටහන් මගින් රු.1,132,942,759 ක් ගිණුම්ගත කිරීමෙන් ප්‍රත්‍යාගණිත අගය වැඩිවීම රු.300,630 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | සියළු වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු. 5,039,859 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 30,511,099 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිනුවන්ගොඩ නගරයේ 2019 මැයි 13 දින සිදුවූ කළහකාරි තත්ත්වය මත මධ්‍යම පොදු වෙළඳ සංකීර්ණයේ කඩ 32 කට අලාභානි සිදුවූ අවස්ථාවේදි වූ ගිවිසුම්ගතව සිටි බදුකරුවන් 7 දෙනෙකු හා ගිවිසුම්ගත නොවූ අතුරු බදුකරුවන් 20 දෙනෙකු සඳහා බස් නැවතුම අසල තාවකාලික කඩ කාමර ලබාදීමේදී බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ LGD/06/02/04 පොදු හා 2017 දෙසැම්බර් 06 දිනැති චක්‍රලේඛය පරිදි කටයුතු නොකර කඩ කුලී ලේඛනයේ දීර්ඝ කාලයක සිට පැවත එන මාසික කුලිය පදනම් කරගෙන ගණනය කිරීම් කර තිබූ බැවින් සභාවට රු4,848,000 ක පාඩුවක් සිදුවී තිබූ අතර මේ සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යවා තිබූ ලැයිස්තුවට ආදායම් පරීක්ෂකවරයාගේ ලැයිස්තුවේ ඇතුලත් නොවූ බදුකරුවන් 05 දෙනෙකුගේ තොරතුරු සාවද්‍ය ලෙස ඇතුලත් කර තිබුණි. 2021 පෙබරවාරි 18 දින කරනු ලැබූ කෙෂත්‍ර පරීක්ෂාවේදී කඩ කාමර සංඛ්‍යාවෙන් සියයට 50 කට අධික සංඛ්‍යාවක් ගිවිසුම්ගත අතුරු බදුකරුවන් නොවන අය ව්‍යාපාර පවත්වාගෙන ගොස් තිබූ අතර ඔවුන්ගෙන් රු.15,000 - රු.20,000 දක්වා මාසික කුලියක් අතුරු බදුකරුවන් විසින් අය කරන බව අනාවරණය විය. | තක්සේරු වාර්තාව ලැබී ඇත්තේ 2019 දෙසැම්බර් 09 දින බැවින් පැවති කඩ කුලිය පදනම්ව මාස 60 කුලිය අයකර පැවරීම සිදු කර ඇති බව දන්වන අතර කඩ කාමර 20 ක බදුකරුවන්ගේ නම් සංශෝධනය කර ඒ සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බව දන්වමි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු අතර අනුමැතිය සඳහා නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| (ආ) පොදු වෙළඳ සංකීර්ණයේ නව ගොඩනැඟිල්ල ඉදි කිරීම සඳහා එහි පෙර තිබූ කඩා ඉවත් කරන ලද පැරණි සති පොළ භූමියට බොරළු පස් පුරවා සැකසීමට බොරළු පස් කියුබ් 1002 ක් යොදා ඇති බව තාක්ෂණ නිලධාරි ගණනය කර වාර්තා කර තිබුණි. 2019-2020 නව ඉදි කිරීම් කාලය තුළ එහි පිරවීම් කර තිබූ පස් හා කැණීම් කිරීමේදී ඉවත් කර තිබූ පස් සමඟ පස් කියුබ් 717.97 ක් එම වැඩ බිමෙන් පස් ඉවත් කර ප්‍රවාහනය කර තිබූ බව වාර්තා ඉදිරිපත් කර තිබූ අතර මෙම පස් ඉවත් කිරීම හා ප්‍රවාහනය සම්බන්ධයෙන් ඉදි කිරීම් සමාගම සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. කොන්ත්‍රාත් සමාගම විසින් මෙම භූමියෙන් ඉවත් කරන පස් ඔවුන්ගේ ඉදි කිරීමේ පිරවීම් කටයුතු සඳහා යොදා නොගන්නා බව ලිඛිතව දන්වා තිබියදී, වැඩ බිමෙන් පස් ඉවත් කිරීම හා ඒවා ස්ථාන ගත කිරීම සම්බන්ධව විධිමත් ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එම පස් ප්‍රමාණයෙන් කොටසක් ආගමික ස්ථාන හා පුණ්‍ය කටයුතු සථාන කිහිපයකටත් හා සභාව සතු ඉඩමකටත් බැහැර කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. | ගිවිසුමකට ඇතුළත්ව විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතුවේ. |